# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී මූලික කුටුම්භයන්හි සමාජ - ආර්ථික තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

# FEMALE HEADED HOUSEHOLDS IN SRI LANKA :

# A SOCIOLOGICAL STUDY

A Dissertation Submitted in Partial Fulfillment of the Requirements of the

## MSSC DEGREE IN SOCIOLOGY

## 2007 / 2008

**Registration Number – FGS/SOCI/MC/08/004**


**Department of Sociology,**

**Faculty of Arts,**

**University of Kelaniya,**

**Sri Lanka.**



ප්‍රවේශ අංකය: 844

වර්ග අංකය:


**Name of Supervisor: DR. H.W. Karunarathna**

# සාරාංශය

පුරුෂ මූලික සමාජ ක්‍රමයක් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ පමණක් නොව, ලෝකය පුරාම ස්ත්‍රීන්ට හිමිවන්නේ පහත් හා දෙවන ස්ථානයක් බව බොහෝ කාන්තාවාදී න්‍යායාචාර්යවරුන් පෙන්වා දී තිබේ. මෙවැනි සමාජ ක්‍රමයක් තුළ සමස්ත ලෝකයේම ස්ත්‍රී මූලික කුටුම්භ වර්ධනය වීමේ හා ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවයක් පවතින බව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන මගින් හෙළිවේ. ශ්‍රී ලංකාව තුළ ද මෑත කාලීනව ජනගහන ව්‍යුහයේ ඇති වූ වැදගත් වෙනස්කමක් වශයෙන් ස්ත්‍රී මූලික කුටුම්භයන්හි සිදුවූ වර්ධනය හා ව්‍යාප්තිය පෙන්වාදිය හැක. පුරුෂ මූලික සමාජ ක්‍රමයක් තුළ කාන්තාවකට කුටුම්භයක ආර්ථික හා සමාජීය වගකීම් භාර ගැනීමට සිදුවීම එම කුටුම්භයේ සාමාජිකයන්ටත්, පොදුවේ සමාජයටත් කවරාකාර බලපෑමක් සිදු කරන්නේද යන්න හඳුනා ගැනීම වැදගත්ය.

ස්ත්‍රී මූලික කුටුම්භ ස්වභාවිකවම ඇතිවන්නක් සේ පෙනුණද එම කුටුම්භ ඇතිවීම කෙරෙහි ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික හේතු සාධක රාශියක් බලපෑම් කරන බව පෙනී යන හෙයින් ඒ පිළබඳ ගැඹුරු අධ්‍යයනයක් කිරීම වැදගත් වේ. මෙම ස්ත්‍රී මූලික කුටුම්භ ලොව බොහෝ සමාජ හා සමාජ මානව විද්‍යාඥයන්ගේ අවධානයට ලක් වුවද, ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමාණවත් සමාජ මානව විද්‍යාත්මක හෝ ප්‍රජා විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැත. එසේම ස්ත්‍රී මූලික කුටුම්භ වර්ධනය වීමට තුඩු දෙන සමාජ, ආර්ථික පසුබිම තුළ එම ගෘහ කුටුම්භ ආශ්‍රිතව පවතින ගැටළු හඳුනා ගැනීම මෙන්ම ඒවාට විසඳුම් ලබාදීමද වැදගත් කාර්යයක් වේ.

මේ නිසා කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය පරිදි ස්වාධීන නිබන්ධනය වශයෙන් “ශ්‍රී ලංකාවේ ස්ත්‍රී මූලික කුටුම්භයන්හි සමාජ, ආර්ථික තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක් “ යන මාතෘකාව තෝරා ගන්නා ලදි. ඒ තුළින් ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවතින ස්ත්‍රී මූලික පවුල් වල වර්තමාන සමාජ, ආර්ථික තත්ත්වයන්, ඔවුන් මුහුණ දෙන ගැටළු ආදිය සාකච්ඡා කොට, ඔවුන්ගේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා පියවර ගත යුත්තේ කෙසේදැයි හඳුනා ගැනීමට උත්සාහ දරන ලදි.



**Key Words :**

- පවුල
- ස්ත්‍රී මූලික කුටුම්භ
- වැන්දඹුභාවය
- ආර්ථික, සමාජීය හේතු
- බලසතුකරණය